# කාර්ය සාධන වාර්තාව
# 2014

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව



# පණිවුඩය

ශ්‍රී ලංකා පොලිසියට ශතවර්ෂ එකහමාරක් සපුරාලීමට තවත් ඇත්තේ වසර 02 ක් වැනි කෙටි කාලයකි. දිනයේ පැය 24 පුරාම රාජකාරී සිදුකරන පොලිසිය වර්ෂයක් තුළ කරනු ලබන රාජකාරි ප්‍රමාණය සාපේක්ෂව සුවිශාලය. මෙම කාර්යයන් බොහොමයක් සිදුවන්නේ සමාජ සේවාවන් ලෙසවීම තවත් සුවිශේෂී තත්වයකි. වාර්ෂිකව සිදුකරනු ලබන කාර්යභාරය විස්තරාත්මකව සහ සන්සන්දනාත්මකව වාර්ෂික පොලිස්පති පරිපාලන වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලැබේ. රට පරිබාහිරව අප විසින් වසරක් තුළ සැළසුම් කරන ලද වැඩසටහන්වල සංකල්ප සහ යෝජනාවන් කොතෙක් දුරට සාර්ථකව ඉටුකර ගත හැකිවීද යන්න සොයා බැලීමටත්, ඉදිරි වර්ෂය තුළ සිදුකළ යුතු සේවාවන් පුළුල්කිරීම සඳහා මූලාශ්‍ර කරගැනීම සඳහාත් කණ්ඩායමක් ලෙස අත්කරගත් මූල්‍ය ප්‍රගතිය ඇතුළු සමස්ථ ප්‍රගතිය සමාලෝචනය කිරීමත් මෙම කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වේ.

2014 වර්ෂය ආරම්භයේදීම රාජ්‍ය සේවා ප්‍රතිඥාවට අනුගත වෙමින් සංවිධානාත්මකව රජයත් රටත් බලාපොරොත්තු වන සේවාවන් ඉටුකිරීමට අප පෙලගැසුනේ දිනාදුන් භූමියේ සාමය පවත්වාගනිමින් එය සුරක්ෂිත කරගැනීම සඳහාය. අපරාධ නිවාරණය, මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම, රිය අනතුරු වැළැක්වීම තුළින් ඒ සඳහා අපතේ යන මුදල් ඉතිරි කොට රටේ සිදු වන සුවිශාල සංවර්ධනයට දායකවීමට හැකිවීම අපලද ජයග්‍රහණයකි. එමෙන්ම ජනතාවගේ යහපත් සෞඛ්‍ය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය රැකවරණය ලබා දීම තුළින් පොලිසිය රටේ මානව සම්පත් සංවර්ධනයටද දායක වී ඇත.

ශ්‍රී ලංකා පොලිසිය ගොඩනැගී ඇත්තේ එකිනෙකා වගකීමෙන් සහ වගවීමෙන් කටයුතු කිරීමට බැඳුණු දම්වැළක පුරුක් මෙනි. යම් කටයුත්තක් නිවැරදිව ඉටුකිරීම සඳහා සියළු දෙනාගේම කැපවීම හා දායකවීම අනිවාර්ය වේ. පසුගිය වර්ෂය පුරා ශ්‍රී ලංකා පොලිසිය තුළ සියළු ක්ෂේත්‍රයන්ගේ ඵලදායිත්වය හා සාර්ථකත්වය අත් කරගත් ආකාරය සහ සියළු අභියෝගයන්ට මුහුණ දුන් ආකාරය පිළිබඳ මෙම වාර්තාව මගින් විමසුමට භාජනය කරන මෙන්, මම ශ්‍රී ලංකා ජනරජයේ පොලිස්පතිවරයා ලෙස ඔබ හට ඇරයුම් කරමි.

**එන්.කේ. ඉලංගකෝන්**

**පොලිස්පති**

# පෙළගැස්ම


| ක්ෂේත්‍රය | | පිටු අංකය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පොලිසිය නිළයන්ගේ ධුරාවළිය සහ හට සංඛ්‍යාව | 01 - 06 |
| 02. | අපරාධ මර්දනය සහ විමර්ශනය. | 07 - 08 |
| 03. | විවිධ පැමිණිලි විමර්ශනය | 09 - 09 |
| 04. | රථවාහන කළමණාකරණය සහ මාර්ග ආරක්ෂාව | 10 - 10 |
| 05. | මත් පැන් සහ මත් ද්‍රව්‍ය නිවාරණය | 11 - 13 |
| 06. | දුෂණ මර්දනය සහ ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම් | 13 - 13 |
| 07. | ප්‍රජා පොලිස් සේවය | 14 - 15 |
| 08. | පරිසර ආරක්ෂණය | 16 - 16 |
| 09. | පොලිස් මුලස්ථානයෙන් ක්‍රියාත්මක වන මහජන සේවාවන් | 17 - 17 |
| 10. | මානව සම්පත් ප්‍රවර්ධනය | 18 - 20 |
| 11. | භෞතික සම්පත් සංවර්ධනය | 21 - 21 |
| 12. | මුල්‍ය ප්‍රගතිය | 22 - 22 |
| 13. | 2014 වර්ෂයේ කාර්ය සාධනය සැකෙවින් | 23 - 23 |




## දැක්ම

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.

## මෙහෙවර

සැමට සමාන,
කිසිවකුටත් අගතියක්
සිදුකිරීමකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමටත්,
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලීසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.

# 01. ශ්‍රී ලංකා පොලිස් නිළ ධූරාවලිය සහ භට සංඛ්‍යාව



පොලිස්පති

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - 10 (අනුමත සංඛ්‍යාව 11)

නියෝජ්‍ය පොලිස්පති - 28 (අනුමත සංඛ්‍යාව 38)

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පිරිමි - 97
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාන්තා - 0

පොලිස් අධිකාරී පිරිමි -29
පොලිස් අධිකාරී කාන්තා - 0

සහකාර පොලිස් අධිකාරී පිරිමි -339
සහකාර පොලිස් අධිකාරී කාන්තා - 10

ප්‍රධාන පොලිස් පරීක්ෂක පිරිමි - 696
ප්‍රධාන පොලිස් පරීක්ෂක කාන්තා - 17

පොලිස් පරීක්ෂක පිරිමි - 2523
පොලිස් පරීක්ෂක කාන්තා - 249

උප පොලිස් පරීක්ෂක පිරිමි - 4536
උප පොලිස් පරීක්ෂක කාන්තා - 558


මහ සැරයන් - 45

පොලිස් සැරයන් පිරිමි - 15756
පොලිස් සැරයන් කාන්තා - 1409
පොලිස් සැරයන් රියදුරු - 546


පොලිස් කොස්තාපල් පිරිමි - 47647
පොලිස් කොස්තාපල් කාන්තා - 5924
පොලිස් කොස්තාපල් රියදුරු - 546

අනුමත පිරිස් සංඛ්‍යාව 84145 ක් වන අතර දැනට 73209 ක පිරිස් බලයක් සේවයේ යෙදී සිටී. මෙයට විශේෂ කාර්ය බලකායේ භට සංඛ්‍යාව ඇතුළත් නොවේ.


## 1.1 පොලිස් පරිපාලන ව්‍යුහය




## 1.2 ප්‍රාදේශීය පොලිස් කොට්ඨාශ ව්‍යුහය



## 1:3 ක්‍රියාකාරී කොට්ඨාශ



## 1.4 විශේෂ කාර්ය බලකායේ ව්‍යුහය හා කාර්යභාරය



**විශේෂ කාර්ය බලකායේ කාර්යභාරය**

01. අපරාධ මර්දන මෙහෙයුම් සිදු කිරීම (සංවිධානාත්මක අපරාධ)

02. දෙස් විදෙස් ප්‍රභූ ආරක්ෂක රාජකාරී

03. සෝදිසි හා බෝම්බ නිශ්ක්‍රිය මෙහෙයුම් සිදු කිරීම.

04. නීතිය හා සාමය ආරක්ෂා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුවට සහයවීම.

05. ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන හදිසි ආපදා තත්වයන් වලදී ජන ජීවිතය යථාතත්වයට පත්කිරීමට සහය වීම.

06. සමාජ විරෝධි අවකල් ක්‍රියා මැඩපැවැත්වීමට කටයුතු කිරීම (නීති විරෝදී මත්කුඩු ජාවාරම, ගංජා ජාවාරම් වැනි දෑ)

07. ස්වභාව ධර්මයේ දායාදයන් සුරැකීම හා මිනිසා විසින් සිදු කරනු ලබන පාරිසරික විනාශයන් වැළැක්වීමට කටයුතු කිරීම.


08. ජීවිතාරක්ෂක කටයුතු සිදුකිරීම.

## 02. අපරාධ මර්දනය සහ විමර්ශනය

- **දිවයින තුළ බල අපරාධ වාර්තාවීම**

2014.01.01 සිට 2014.12.31 දක්වා කාලය තුළ දිවයින තුළ බල අපරාධ 50962 ක් වාර්තා වී ඇත. එයින් වර්ෂය අවසාන වනවිට 29396 ක් විසදා ඇති අතර විසදීමේ ප්‍රතිශතය 58% කි. 2013 වර්ෂයට වාර්තා වී ඇති මුළු බල අපරාධ ප්‍රමාණය 55349 කි. ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂව 2014 වර්ෂයේ බල අපරාධ වාර්තාවීම 8% ක අඩුවීමකි.

**ප්‍රස්ථාර අංක 01**





මූලාශ්‍රය : පොලිස් අපරාධ කොට්ඨාසය

- **දිවයින තුළ දරුණු ගණයේ අපරාධ වාර්තාවීම.**

2014.01.01 සිට 2014.12.31 දක්වා කාලය තුළ දිවයින තුළ දරුණු ගණයේ අපරාධ 12656 ක් වාර්තා වී ඇත. එයින් වර්ෂය අවසාන වනවිට 7403 ක් විසදා ඇති අතර විසදීමේ ප්‍රතිශතය 58% කි. 2013 වර්ෂයට වාර්තා වී ඇති දරුණු ගණයේ අපරාධ ප්‍රමාණය 13220 කි. ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂව 2014 වර්ෂයේ දරුණු ගණයේ අපරාධ වාර්තාවීම 4% ක අඩුවීමකි.

**ප්‍රස්ථාර අංක 02**





මූලාශ්‍රය : පොලිස් අපරාධ කොට්ඨාසය

ඉහත දත්තයන් අනුව 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ බල අපරාධ වාර්තාවීම 8% කින් සහ දරුණු ගණයේ අපරාධ වාර්තාවීම 4% කින් අඩු කර ගැනීමට හැකිවීම 2014 වර්ෂය තුළ පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවයේ වර්ධනය මැනවින් පිළිබිඹු වීමකි.

- **බිහිසුණු අපරාධ වාර්තාවීම අඩුකර ගැනීමට හැකිවීම පිළිබඳව**

**ප්‍රස්ථාර අංක 03**




මූලාශ්‍රය : පොලිස් අපරාධ කොට්ඨාසය

ජන සමාජය තුළ ආන්දෝලනයට තුඩුදෙන මහජනයාට බිය සහ ත්‍රාසය ඇති කරන ශරීරයට එරෙහිව හා දේපළවලට එරෙහිව වාර්තා වී ඇති දරුණු ගණයේ අපරාධ අනුව 2014 වර්ෂයට මනුෂ්‍යඝාතන වාර්තාවීම 06% කින්ද, ස්ත්‍රී දූෂණ වාර්තාවීම 07% කින්ද, කොල්ලකෑම් වාර්තාවීම 17% කින්ද, ගෙවල් බිඳුම් වාර්තාවීම 0.1% කින්ද, සොරකම් වාර්තාවීම 02% කින්ද, අඩුකර ගැනීමට හැකිවීම 2014 තුළ ලබා ඇති විශේෂ ප්‍රගතියකි. සමස්ථයක් ලෙස මෙම ප්‍රගතිය අත්කර ගැනීම සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතයද කැපී පෙනේ. උදාහරණ ලෙස අපරාධ කරුවන්ගේ ඇඟිලි සලකුණු ස්වයංක්‍රියව හඳුනා ගැනීමේ පද්ධතිය 2014 වර්ෂයේදී හඳුන්වා දීම තුළ අපරාධ විමර්ශනය වේගවත් වී ඇත.

## 2.1 කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි අපරාධ පාලනය

කාන්තාවන්ට හා ළමයින්ට හිමි ස්ථානය එම රටේ ප්‍රගමනය හා සමාජ සුරක්ෂිතතාවය මැනීමේ නිර්ණායකයක් ලෙස සැලකේ. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය ළමා හා කාන්තා සුරක්ෂිතතාවය පිළිබඳව ප්‍රමුඛ අවධානයක් යොමු කොට ක්‍රියා කරයි. සියළුම පොලිස් ස්ථානවල පිහිටා ඇති ළමා හා කාන්තා අංශය මගින් ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි අපරාධ විමර්ශනයට හා විසඳීමට ප්‍රමුඛතාවයක්දී කටයුතු කර ඇති අයුරු පහත වගුව ආශ්‍රයෙන් හඳුනාගත හැක. ඒ අනුව පසුගිය වර්ෂ 02 ට සාපේක්ෂව 2014 වර්ෂයේ අපරාධ විසඳීමේ ප්‍රගතියක් පෙන්නුම් කෙරේ.

**කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තා වීම්**

**වගු අංක 01**

| අපරාධ වර්ගය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| ළමයින්ට එරෙහි අපරාධ | 6,038 | 1,263 | 6,040 | 2,109 | 5,868 | 1,648 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 7,798 | 2,062 | 8,320 | 4,672 | 8,434 | 4,399 |
| එකතුව | **13,836** | **3,325** | **14,360** | **6,781** | **14,302** | **6,047** |

මූලාශ්‍රය - පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය

## 03. විවිධ පැමිණිලි විමර්ශනය

විවිධ පැමිණිලි විමර්ශනය පොලිසියේ හදවත බඳුය. දිනපතා පොලිසියට ලැබෙන විවිධ පැමිණිලි ප්‍රමාණය ඉතා විශාල වුවද ඒවා කඩිනමින් විසඳීමට පොලිසිය නිරතුරුව වගබලා ගනී. 2014 වර්ෂයේ විවිධ පැමිණිලි විසඳීම පහත සංඛ්‍යා වගුව අනුව හඳුනා ගත හැකිය.

**වගු අංක 02**

| වාර්තාවු පැමිණිලි වල ස්වභාවය | | වාර්තා වු ප්‍රමාණය | සත්‍ය පැමිණිලි ප්‍රමාණය | විමර්ශනය කළ ප්‍රමාණය | පොලිසිය මගින් සමථ කළ ප්‍රමාණය | සමථ මණ්ඩලය මගින් විසදු ප්‍රමාණය | ඉවත් කර ගත් ප්‍රමාණය | විමර්ශනය වෙමින් පවතින ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | **පහරදීම්** | 202137 | 202137 | 201778 | 155141 | 16660 | 20404 | 9573 |
| 2 | බැණ තර්ජනය කිරීම් | 207845 | 207845 | 207428 | 174457 | 5439 | 19021 | 8511 |
| 3 | පවුල් ආරවුල් | 148327 | 148327 | 148073 | 120161 | 1880 | 19636 | 6396 |
| 6 | ඉඩම් ආරවුල් | 99493 | 99493 | 99209 | 85447 | 3703 | 5560 | 4499 |
| 7 | සාමය කඩකිරීම් | 3933 | 3933 | 3933 | 3174 | 112 | 376 | 271 |
| 8 | විශ්වාසය කඩකිරීම් | 13975 | 13975 | 13890 | 10313 | 553 | 1444 | 1580 |
| 9 | මුදල් සහ භාණ්ඩ සම්බන්ධ ආරවුල් | 128596 | 128596 | 128383 | 104483 | 5266 | 10352 | 8282 |
| 10 | මව්පියන්ට නොසැලකීම | 7863 | 7863 | 7838 | 6335 | 143 | 1007 | 353 |
| 11 | කුලී නිවාස ආරවුල් | 8430 | 8430 | 8420 | 6512 | 266 | 857 | 785 |
| 12 | සේව්‍ය සේවක ආරවුල් | 3778 | 3778 | 3754 | 3022 | 69 | 353 | 310 |
| 13 | අලාභ හානි කිරීම් | 20321 | 20321 | 20177 | 15602 | 1377 | 1896 | 1302 |
| 14 | මානසික රෝග සම්බන්ධ ආරවුල් | 8157 | 8157 | 8121 | 6629 | 212 | 885 | 395 |
| 15 | අතුරුදහන් වීම් | 7333 | 7333 | 7325 | 2662 | 07 | 3466 | 1190 |
| 16 | වෙනත් | 205460 | 205460 | 205084 | 162520 | 6175 | 25167 | 11222 |
| | **Total** | **1065648** | **1065648** | **1063413** | **856458** | **41862** | **110424** | **54669** |

මුලාශ්‍රය : පොලිස් සංඛ්‍යාලේඛන කොට්ඨාසය

විවිධ පැමිණිලි විසඳීම පිළිබඳ 2014 වර්ෂය තුළ ඉතා ඉහල ඵලදායිත්වයක් පෙන්නුම් කරන බවට ඉහත සංඛ්‍යා වගුව සාක්ෂි දරයි. ලැබී ඇති පැමිණිලි 1065648 න් පැමිණිලි 1063413 ක විමර්ශන කටයුතු සිදු කිරීමට පොලිසිය සමත්වී ඇත. එපමණක් නොව ඉන් 856458 ක් පොලිසිය තුළදීම විසඳීම මගින් පොලිස් සේවයේ වෘත්තිය භාවය හා කාර්යක්ෂමතාවය මැනවින් පැහැදිලි වේ.

## 04. රථ වාහන කළමනාකරණය සහ මාර්ග ආරක්ෂාව

මහා මාර්ගය සැමට ආරක්ෂිත ස්ථානයක් බවට පත්කරමින් රිය අනතුරු අවම කිරීම හා ජීවිත හා දේපල හානි වළක්වා ගැනීම පොලිස් දෙපර්තමේන්තුවේ පුමුඛ අභිප්‍රායකි. ඒ සඳහා විශාල මානව සම්පතක් රාජකාරියේ යොදවා ඇති අතර, යොදවා ඇති භෞතික සම්පත් ප්‍රමාණයද අති මහත්ය.

රථ වාහන ප්‍රමාණය දිනෙන් දින ඉහළ ගියද රථ වාහන අනතුරුවල පහළ යාමක් දක්නට ලැබෙණුයේ පොලිස් නිලධාරියාගේ සහ නීති ගරුක ජනතාවගේ ක්‍රියාකාරිත්වය හේතුවෙනි. පොලිස් රථ වාහන අංශ මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සහ විවිධ පාර්ශවයන් වෙත සිදු කරනු ලබන දැනුවත් කිරීම්ද රිය අනතුරු අවම කොට මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමෙහිලා පිටුවහලක් වී ඇති බව පහත සංඛ්‍යා වගු මගින් පිළිඹිබු වේ.

රථවාහන අනතුරු

වගු අංක 03

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | මාරක අනතුරු මරණ සංඛ්‍යාව | වාහන සංඛ්‍යාව | වාහන 1,000කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| **2012** | 2,317 | 7,209 | 14,680 | 17,939 | 42,145 | 2,444 | 4,877,027 | 9 |
| **2013** | 2,190 | 6,870 | 13,525 | 15,292 | 37,877 | 2,324 | 5,203,678 | 7 |
| **2014** | 2,261 | 6,847 | 12,950 | 13,992 | 36,050 | 2,436 | 5,633,234 | 6 |

මූලාශ්‍රය : පොලිස් සංඛ්‍යාලේඛන කොට්ඨාසය

### 4: 1 පොලිස් නිලධාරීන් සඳහා රථවාහන පුහුණු පාඨමාලා

වගු අංක 04

| කාල සීමාව සිට -දක්වා | තනතුරු | නිලධාරීන් සංඛාව |
|---|---|---|
| 2014.01.20- 2014.01.24 | පො.ප./ උ.පො.ප./ පො.සැ./ පො.කො./ පො.කො.රි | 39 |
| 2014.04.07-2014.04.12 | පො.සැ./ පො.කො./ කා.පො.කො. | 64 |
| 2014.09.12 | පො.සැ./ පො.කො. | 65 |
| 2014.09.13 | පො.සැ./ පො.කො. | 65 |
| | **එකතුව** | **233** |

මූලාශ්‍රය : පොලිස් රථ වාහන මූලස්ථානය

### 04:2 විවිධ පාර්ශව මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම්

වගු අංක 05

| වැඩසටහන් | මුලු වැඩසටහන් | පාසල් සංඛ්‍යාව | ළමුන් සංඛ්‍යාව | පදිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පාසල් දේශන | 65 | 350 | 40535 | - |
| රිය නියාමක වැඩ සටහන් | 39 | 250 | 2916 | - |
| සංදර්ශන | 45 | 350 | 40000 | 7000 |
| ප්‍රදර්ශන කුටි | 02 | 100 | 40000 | 45000 |
| **එකතුව** | **151** | **1050** | **1,23451** | **52000** |

මූලාශ්‍රය : පොලිස් රථවාහන මූලස්ථානය

## 05. මත්පැන් සහ මත්ද්‍රව්‍ය නිවාරණය

සමාජය තුළ ප්‍රබල ව්‍යසනයක්ව පවතින මත්පැන් සහ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ භාවිතය අවම කිරීම සඳහා පොලිසිය විශාල දායකත්වයක් ලබාදෙයි. ඒ සඳහා සිදු කරන ලද වැටලීම් තුළින් විශාල මත්පැන් සහ මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇති අතර, වැටලීම් සහ නඩු පැවරීම් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 96% කි. මත්ද්‍රව්‍ය වැටලීම් හා නඩු පැවරීම් ප්‍රගතියද 96% කි. පහත වගු මගින් මෙම තොරතුරු හඳුනාගත හැක.

**සුරාබදු වැරදි වාර්තාවීම් සහ විසඳීම්**

වගු අංක 06

| # | සුරාබදු වැරදි | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ |
| 1. | නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 6,637 | 6,352 | 8,529 | 8,125 | 7,041 | 6,576 |
| 2. | බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදන | 58 | 58 | 49 | 48 | 21 | 21 |
| 3. | නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම | 104 | 103 | 29 | 25 | 45 | 41 |
| 4. | නීති විරෝධී ලෙස ස්ප්‍රීතු වර්ග නිෂ්පාදනය හෝ පෙරීම | 203 | 193 | 344 | 302 | 712 | 689 |
| 5. | නීති විරෝධී ලෙස මත්පැන් විකිණීම හා ළඟ තබා ගැනීම | 89,966 | 84,781 | 85,655 | 82,436 | 82,042 | 79,386 |
| 6. | නීති විරෝධී මහ රා විකිණීම හා ළඟ තබා ගැනීම | 5,361 | 5,106 | 7,241 | 6,678 | 6,160 | 5,900 |
| 7. | බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ලීටර් 7.5 ට වඩා ළඟ තබා ගැනීම | 14,710 | 14,164 | 14,354 | 13,692 | 12,358 | 11,421 |
| 8. | බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත් පැන් වර්ග විකිණීම / විකිණීම සඳහා ළඟ තබා ගැනීම | 1,333 | 1,258 | 1,889 | 1,775 | 1,479 | 1,427 |
| 9. | නීති විරෝධී ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රීතු වර්ග ළඟ තබා ගැනීම හා විකිණීම | 298 | 296 | 487 | 474 | 545 | 540 |
| 10 | නීති විරෝධී මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා අනෙකුත් ස්ප්‍රීතු වර්ග/රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම (ලීටර් 7.5 ට වැඩි) | 386 | 380 | 351 | 341 | 355 | 336 |
| 11. | නීති විරෝධී මත්පැන්/ස්ප්‍රීතු වර්ග මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ළග තබා ගැනීම | 515 | 489 | 487 | 458 | 351 | 344 |
| 12. | සුරාබදු ආඥා පනත යටතට වැටෙන අනෙකුත් වැරදි | 5,797 | 5,617 | 5,188 | 4,844 | 3,681 | 3,553 |
| | **එකතුව** | **125,371** | **118,797** | **124,603** | **119,198** | **114,790** | **110,234** |

මූලාශ්‍රය: පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය

නිද්‍රාජනක ද්‍රව්‍ය

වගු අංක 07

| # | නිද්‍රාජනක ද්‍රව්‍ය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ |
| 1 | ගංජා | 36,384 | 34,970 | 45,921 | 44,651 | 46,884 | 45,997 |
| 2 | අබිං | 5 | 5 | 11 | 10 | 1 | 1 |
| 3 | හෂිස් | 8 | 4 | 10 | 10 | 752 | 660 |
| 4 | හෙරොයින් | 16,886 | 15,283 | 24,400 | 22,966 | 23,578 | 22,041 |
| 5 | මෝෆීන් | 2 | 2 | 12 | 12 | 2 | 2 |
| 6 | කොකේන් | 6 | 0 | 0 | 0 | 4 | 4 |
| 7 | වෙනත් | 2,459 | 2,256 | 3,029 | 3,029 | 3,145 | 3,007 |
| එකතුව | | **56,230** | **52,520** | **73,383** | **70,678** | **74,366** | **71,712** |

මූලාශ්‍රය: පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය

## 06. දූෂණ මර්දනය සහ ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම්.

2014 වර්ෂයේ දූෂණ මර්දනය සහ ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධයෙන් පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ ක්‍රියාකාරිත්වය පහත වගුව මගින් හඳුනාගත හැකිය.

දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි

වගු අංක 08

| # | වරද | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ |
| 1 | දූෂණ වැරදි (6) | 3,369 | 3,192 | 2,724 | 2,627 | 1,921 | 1,856 |
| 2 | ව්‍යවස්ථාපිත වැරදි (31) | 73,854 | 71,044 | 73,124 | 69,541 | 54,877 | 52,998 |

මූලාශ්‍රය: පොලිස් සංඛ්‍යාලේඛන කොට්ඨාසය

වගුවට අනුව දූෂණ වැරදි විසඳීමේ ප්‍රගතිය 97% ක මට්ටමේ පවතින අතර, 2012,2013 වර්ෂවලට සාපේක්ෂව දූෂණ වැරදි වල අඩුවීමක්ද පෙන්නුම් කෙරේ. එමෙන්ම ව්‍යවස්ථාපිත වැරදි විසඳීමේ ප්‍රගතිය 96% ක පමණ සාර්ථක මට්ටමක පවතී.

දූෂණ සහ ව්‍යවස්ථාපිත වැරදි සම්බන්ධ වැටලීම් වලදී විශේෂ කාර්ය බලකායේ දායකත්වයද කැපී පෙනේ. ඒ අනුව සිදුකළ වැටලීම් 601 කදී සහ අත්අඩංගුවට ගැනීම් 1121 කදී විශේෂ කාර්ය බලකායේ සහාය හිමිවී ඇත.

## 07. ප්‍රජා පොලිස් සේවය

නීතිය හා සාමය ආරක්ෂා කරමින් සමාජ සුරක්ෂිතතාවය සඳහා පොලිස් නිළධාරීන් ප්‍රජාව සමග එක්ව ක්‍රියා කිරීම ප්‍රජා පොලිස් සේවයේ අරමුණයි. මෙහි පරමාර්ථය ප්‍රජාවේ සහයෝගයෙන් ප්‍රජාවටම සේවය සැපයීමයි. යුද්ධය පැවති සමයේ ත්‍රස්ථක්‍රියා මර්දනය සඳහා මහගු දායකත්වයක් ලබාදුන් සිවිල් ආරක්ෂක කමිටු ක්‍රමය 2014 වර්ෂයේද සාර්ථකව ක්‍රියාත්මකවී ඇති ආකාරය පහත වගු මගින් හඳුනාගත හැක.

**ප්‍රජා පොලිස් සිවිල් ආරක්ෂක කමිටු සහ රැස්වීම්**

**වගු අංක 09**

| අනු අංකය | සිවිල් ආරක්ෂක කමිටු | පිහිට වූ කමිටු ගණන | පැවැත් වූ කමිටු ගණන |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් කමිටු ගණන | 24 | 97 |
| 02 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ කමිටු ගණන | 331 | 3,401 |
| 03 | උපදේශක කමිටු ගණන | 429 | 4,924 |
| 04 | ග්‍රාමීය සිවිල් ආරක්ෂක කමිටු ගණන | 14,046 | 306,222 |
| 05 | පොලිස් ස්ථාන (මව්) කමිටු ගණන | 429 | 4,905 |
| **එකතුව** | | **15,259** | **319,549** |

මූලාශ්‍රය : ප්‍රජා පොලිස් කොට්ඨාසය

සිවිල් ආරක්ෂක කමිටු මගින් සමාජයේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි වැඩ සටහන් ක්‍රියාත්මක කෙරේ. පහත වගුවට අනුව 2014 වර්ෂයේ එබඳු වැඩසටහන් 52,4,270 ක් ක්‍රියාත්මක කොට ඇත.

**ප්‍රජා පොලිස් සිවිල් ආරක්ෂක කමිටු වල කාර්යයන්**

**වගු අංක 10**

| අනු අංකය | විස්තරය | ගණන |
|---|---|---|
| 01 | ප්‍රජා පොලිස් සේවාවන් මගින් පාසල් දරුවන් දැනුවත් කිරීමේ දේශන | 19,369 |
| 02 | ප්‍රජා වෘත්තිය පුහුණු සඳහා මාර්ගෝපදේශන වැඩසටහන් | 3,091 |
| 03 | ප්‍රජා වෘත්තිය පුහුණු සඳහා පාසල් වෑන් රථ රියදුරන් දැනුවත් කිරීම | 9,977 |
| 04 | ප්‍රජා පොලිස් සේවාවන් මගින් පාසල් දරුවන් සඳහා විවිධ ක්‍රීඩා තරඟ පැවැත්වීම. | 3,107 |
| 05 | අපරාධ/ළමා හිංසන/කාන්තා හිංසන/රථ වාහන/මත්ද්‍රව්‍ය ආදිය | 186,189 |
| 06 | ඩෙංගු ඇතුළු බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම | 156,089 |
| 07 | ළමා හිංසන/ළමා අපචාර/නායකත්ව ආදිය | 19,369 |
| 08 | පාසල් හැරගිය දරුවන් දැනුවත් කිරීම් | 3,091 |
| 09 | පාසල් වෑන් රථ රියදුරන්/සහයකයින් දැනුවත් කිරීම | 9,977 |
| 10 | බස් රථ/ත්‍රිවිල්/ලොරි හා අනෙකුත් වාහන රියදුරන් දැනුවත් කිරීම් | 26,312 |
| 11 | මත්ද්‍රව්‍ය හා මත්පැන් දුරු කිරීම සඳහා දැනුවත් කිරීම | 30,858 |
| 12 | වෙනත් දැනුවත් කිරීම් | 61,351 |
| **එකතුව** | | **524,270** |

මූලාශ්‍රය : ප්‍රජා පොලිස් කොට්ඨාසය

විවිධ අපචාර හා අපරාධ පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීම සහ ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සිවිල් ආරක්ෂක කමිටු මගින් 2014 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් පහත වගුව මගින් දක්වා ඇත.

**වගු අංක 11**

| **අනු අංකය** | **පළාත** | **පාසල් දරුවන් දැනුවත් කිරීමේ දේශණ උදා:- ළමා හිංසන/ ළමා අපචාර/ නායකත්ව ආදීය** | **පාසල් දරුවන් අතර කථික තරග/ චිත්‍ර තරග / අනෙකුත් ක්‍රීඩා තරග පැවැත්වීම.** |
|---|---|---|---|
| 01 | මධ්‍යම | 4028 | 1883 |
| 02 | සබරගමුව | 1974 | 94 |
| 03 | ඌව | 1945 | 200 |
| 04 | දකුණ | 2470 | 217 |
| 05 | නැගෙනහිර | 1627 | 105 |
| 06 | උතුර | 1433 | 176 |
| 07 | උතුරු මැද | 1355 | 33 |
| 08 | වයඹ | 2092 | 170 |
| 09 | බස්නාහිර | 2445 | 229 |
| | **එකතුව** | **19369** | **3107** |

මූලාශ්‍රය : ප්‍රජා පොලිස් කොට්ඨාසය

## 08. පරිසර ආරක්ෂණය

පරිසර ආරක්ෂණ කොට්ඨාශය මුලු දිවයිනම ආවරණය කරමින් දිවයින පුරා පිහිටි පොලිස් ස්ථානවල පරිසර අංශ හා සම්බන්ධ වී මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශිය සභාද කොළඹ හා තදාසන්න ප්‍රදේශවල අබාන්ස්, බර්න්ස්, ක්‍යාක්ලින් වැනි පුද්ගලික ආයතනද සමග ඒකාබද්ධ වී නගර අලංකාරවත් ලෙස තබා ගැනිම සඳහා කටයුතු කරන අතර ශ්‍රමදාන කටයුතු සංවිධානය කරමින් ඒවා දිවයින පුරා ව්‍යාප්ත කරමින් විවිධ වු වැඩ සටහන් රාශියක් 2014 වර්ෂයේද ක්‍රියාත්මක කර ඇත.

විශේෂයෙන් දිවයින පුරා ව්‍යවසනයක්ව පවතින ඩෙංගු රෝගය ව්‍යාප්ත විම පාලනය කිරිම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශය හා එක්ව විශේෂිත වු වැඩ සටහන් වර්ෂය පුරාම ක්‍රියාත්මක කිරිම නිසා දැනට ඩෙංගු රෝගය සෑහෙන දුරට මැඩ පවත්වා ගැනීමට හැකි වී ඇත.

තවද බස්නාහිර පළාත තුළ වැසි කාලයට පවතින ගංවතුර තර්ජනයට සාර්ථකව මුහුණ දිම සඳහා බස්නාහිර පළාත තුළ පිහිටි සියලුම ඇළ මාර්ග ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව සමග ඒකාබද්ධ වී පුලුල් කොට ක්‍රමාණුකූලව සකස් කොට දිනපතා එය පවිත්‍ර කිරීමට භාජනය කිරිම හා ඒවා නඩත්තු කිරීමද සිදු කරනු ලබයි.

2014 වර්ෂයේද ඉහත වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පරිසරය සුරකිම සඳහා කැපවී ක්‍රියා කර ඇත.




ඇළ මාර්ග පවිත්‍රතාවය අධීක්ෂනය කිරීමේ අවස්ථා

# 09. පොලිස් මුලස්ථානයෙන් ක්‍රියාත්මක වන මහජන සේවාවන්

## 09.1 පොලිස්පති මහජන සහන සේවාව

පොලිස්පතිවරයාගේ සෘජු අවධානයට ලක්වන සේවාවක් ලෙස මෙම සේවාව ක්‍රියාත්මක වන අතර ජනතාවගේ ගැටළු වලට ඉතා සාර්තකව විසඳුම් ලබාදීමේ ක්‍රම වේදයක් ලෙසද හඳුනාගෙන තිබේ.

වගු අංක 12

| අනු අංකය | පළාත | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය කර ඇති සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත | 950 | 845 | 105 |
| 02 | දකුණු පළාත | 148 | 143 | 06 |
| 03 | සබරගමු පළාත | 103 | 96 | 17 |
| 04 | වයඹ පළාත | 100 | 87 | 13 |
| 05 | මධ්‍යම පළාත | 67 | 60 | 07 |
| 06 | උතුරු මැද පළාත | 29 | 28 | 01 |
| 07 | නැගෙනහිර පළාත | 17 | 16 | 01 |
| 08 | උතුරු පළාත | 13 | 09 | 04 |
| 09 | ඌව පළාත | 23 | 23 | - |

මූලාශ්‍රය : පොලිස් දුක්ගැනවිලි කොට්ඨාසය

2014 වර්ෂයේ මෙම සේවාව වෙත ලැබුණු පැමිණිලිවලට ඉහළ කාර්ය සාධනයකින් විසඳුම් ලබාදී ඇති අතර, එය 90% ක ප්‍රගතියකන් යුතු බව පහත වගුවෙන් පැහැදිලි වේ.



පොලිස් මුලස්ථානයේ මහජන සහන දිනය ක්‍රියාත්මක වන ආකාරය

## 09.2 119 හදිසි ඇමතුම් සේවය

119 හදිසි ඇමතුම් සේවය ආරම්භයේ සිටම ඉතා කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලෙස ක්‍රියාත්මක වු අතර, 2014 වර්ෂයේද හදිසි ඇමතුම් සේවයට ලැබුණු පැමිණිලි සඳහා සාර්ථක ලෙස විසඳුම් ලබාදී ඇත. ඉහත වගුවට අනුව 2014 වසරේ එහි ප්‍රගතිය 99% ක මට්ටමට ළගාකර ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව සමත්ව ඇත.

වගු අංක 13

| වර්ෂය | පැමිණිලි වර්ගය | | | | | | | විසඳුම් ලබා දුන් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| | අපරාධ | රථ වාහන | දූෂණ | සුළු පැමිණිලි | පවුල් ආරවුල් | වෙනත් | එකතුව | |
| 2013 | 52,113 | 65,114 | 140,540 | 291,924 | 38,777 | 87,801 | **676,269** | **665,900** |
| 2014 | 65,886 | 69,180 | 178,546 | 330,243 | 47,921 | 106,698 | **798,474** | **793,457** |

මූලාශ්‍රය : 119 හදිසි ඇමතුම් සේවය

## 10. මානව සම්පත් ප්‍රවර්ධනය

පොලස් දෙපාර්තමේන්තුව සතු වටිනාම සම්පත මානව සම්පතයි. පොලිස් සේවයේ කාර්යක්ෂම බව, ඵලදායිත්වය සහ වෘත්තිමය භාවය වර්ධනය කිරිම සඳහා මෙම මානව සම්පත සංවර්ධනය කිරිම අත්‍යාවශ්‍ය වේ. බඳවා ගැනිම්, උසස් කිරීම් සහ පුහුණු කිරීම් යන මෙවලම් යොදා ගෙන මානව සම්පත සවිබල ගැන්වීම සඳහා දෙපාර්තමේන්තුව නිරතුරුව ක්‍රියා කරයි.

පහත වගුවලින් දක්වා ඇති පරිදි 2014 වර්ෂයේ පොලිස් දෙපාර්තමේන්තුවේ සහ විශේෂ කාර්ය බලකායේ විවිධ නිළයන්ට 3385 ක් බඳවා ගෙන ඇති අතර, ලබා දී ඇති උසස්වීම් ප්‍රමාණය 405 කි.

### 10.1 ශ්‍රී ලංකා පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ නව බඳවා ගැනිම්

වගු අංක 14

| අනු අංකය | තනතුර | බඳවා ගත් ප්‍රමාණය |
|---|---|---|
| 01 | සහකාර පොලිස් අධිකාරී | 03 |
| 02 | උප පොලිස් පරීක්ෂක | 213 |
| 03 | පොලිස් කොස්තාපල් | 1,370 |
| 04 | පොලිස් කොස්තාපල්/විශේෂ කාර්ය බලකාය | 570 |
| 05 | කාන්තා පොලිස් කොස්තාපල් | 308 |
| 06 | කාන්තා පොලිස් කොස්තාපල්/ විශේෂ කාර්ය බලකාය | 53 |
| 07 | පොලිස් කොස්තාපල් රියදුරු | 798 |
| 08 | පොලිස් කොස්තාපල් රියදුරු/ විශේෂ කාර්ය බලකාය | 70 |
| එකතුව | | **3,385** |

මූලාශ්‍රය : බඳවා ගැනිම් කොට්ඨාසය

### 10.2 ශ්‍රී ලංකා පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ උසස්වීම්

වගු අංක 15

| අනු අංකය | තනතුර | උසස් කළ ප්‍රමාණය |
|---|---|---|
| 01 | පොලිස් අධිකාරී සිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දක්වා | 16 |
| 02 | සහකාර පොලිස් අධිකාරී සිට පොලිස් අධිකාරී දක්වා | 05 |
| 03 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සිට සහකාර පොලිස් අධිකාරී දක්වා | 124 |
| 04 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සිට සහකාර පොලිස් අධිකාරී දක්වා/වි.කා.බ | 15 |
| 05 | පොලිස් පරීක්ෂක සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක දක්වා | 260 |
| එකතුව | | **405** |

මූලාශ්‍රය : පිරිස් හා පාලන කොට්ඨාසය

## 10.3 දේශීය පුහුණු පාඨමාලා

පුහුණුවීම් යටතේ නිළධාරීන් 32205 කට දේශීය පුහුණුවීම් ලබා දී ඇති අතර, අපරාධ විමර්ශනය, නඩු මෙහෙයවීම්, ප්‍රජා පොලිස්කරණය, රථ වාහන පාලනය, ඉංග්‍රීසි සහ ද්විඩ භාෂා ප්‍රවීණත්වය යන ක්ෂේත්‍රයන්හි මෙම පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කර ඇත.

වගු අංක 16

| අනු අංකය | පැවැත් වූ ආයතන | සහභාගී වූ නිලධාරීන් | | | | |
|---|---|---|---|---|---|---|
| | | රාජ්‍ය නිවේදිත නිලධාරීන් | පරික්ෂක ශ්‍රේණියේ නිලධාරීන් | කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන් | වෙනත් | එකතුව |
| 01 | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය | 216 | 1,072 | 59 | - | 1,347 |
| 02 | ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය | 03 | 511 | 1,816 | - | 2,330 |
| 03 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 01 | 19 | 02 | - | 22 |
| 04 | සේවාස්ථ පුහුණු ආයතන | 16 | 1,721 | 25,597 | - | 27,334 |
| 05 | වෙනත් විශ්ව විද්‍යාල හා පුහුණු ආයතන | 63 | 863 | 232 | 14 | 1,172 |
| එකතුව | | **299** | **4,186** | **27,706** | **14** | **32,205** |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය**




පුහුණු වීම් අවස්ථා දැක්වෙන ජායා රූප

## 10.4 විදේශීය පුහුණු පාඨමාලා

පොලිස් නිලධාරීන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම උදෙසාත් අනෙකුත් දියුණු රටවල පොලිස් ආයතන මගින් මහජන සාමය, නීතිය හා අපරාධ වැලක්වීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පර්යේෂණාත්මක නව ක්‍රමෝපායන් සම්බන්ධයෙන් අප නිලධාරීන්ට නියමිත පුහුණුවක් ලබා දීම අරමුණු කොට 2014 වර්ෂය තුළ පහත සඳහන් තනතුරුවලට අදාළව සම්මුඛ පරීක්ෂණයන් මගින් තෝරා ගන්නා ලද නිලධාරීන්/ නිලධාරිනියන් සඳහා පහත අයුරින් විදේශීය පුහුණු පාඨමාලාවන් ලබා දීමට කටයුතු කර ඇත.

වගු අංක 17

| අනු අංකය | පාඨමාලා ප්‍රමාණය | රටවල් ගණන | සහභාගිවූ නිළධාරීන් තනතුරු අනුව |
|---|---|---|---|
| 01 | 73 | 26 | ජ්‍යෙ.නි.පො.ප. 08<br>නි.පො.ප. 09<br>ජ්‍යෙ.පො.අ. 26<br>පො.අ. 07<br>ස.පො.අ. 38<br>ප්‍ර.පො.ප. 12<br>පො.ප. 37<br>උ.පො.ප. 17<br>පො.සැ. 01 |

මූලාශ්‍රය : පොලිස් විද්‍යාලය









විදේශිය පුහුණු වීම් අවස්ථා දැක්වෙන ජායා රූප

## 11. භෞතික සම්පත් සංවර්ධනය

භෞතික සම්පත් සංවර්ධනය මානව සම්පත් සංවර්ධනය තරමටම පොලිස් දෙපාර්තමේන්තුවට වැදගත් වන්නේ මානව සම්පත වඩාත් ඵලදායිවීම සහ කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා භෞතික සම්පත් සංවර්ධනය අතිශය වැදගත් වන බැවිනි.

භෞතික සම්පත් සංවර්ධනය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා 2014 වසරේදි ප්‍රමුඛතාවය ලබාදී ඇත.

### 11.1 පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම.

උතුරු නැගෙනහිර සේවය කරනු ලබන පොලිස් නිළධාරින්ගේ නේවාසික පහසුකම් පිළිබඳ ගැටළුවට කඩිනම් විසඳුමක් ලෙස පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භකළ අතර, එහි සාර්ථකත්වය මත දිවයින පුරාම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ඇරඹිනි. ඒ යටතේ අදියර තුනක් වූ මෙම ක්‍රියාවලියේ පළමු අදියර අවසන් කොට ඇති අතර 2013 - 2015 කාල සීමාව තුළ ඉතිරි අදියර දෙක නිම කිරීමට අපේක්ෂා කොට ඇත. ඒ අනුව 2013 වසරේ පොලිස් කොට්ඨාස 13 ක ගොඩනැගිලි 175 කින් 173 ක් සම්පුර්ණයෙන් නිම කොට ඇත. එය 98% ක ප්‍රගතියකි.

අදියර III යටතේ තවත් කොට්ඨාස 47 ක ගොඩනැගිලි 300 ක් ඉදිරිකිරීමට නියමිත අතර, 2015 දී ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය.

### 11.2 විශේෂ කාර්ය බලකායේ පෙරසවි ගොඩනැගිලි ව්‍යාපෘතිය

විශේෂ කාර්ය බලකායටද විවිධ ප්‍රමුඛ අවශ්‍යතා යටතේ පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලැබී තිබේ. ඒ යටතේ ගොඩනැගිලි 272 ක් ඉදිකිරීමට නියමිත අතර 2014 වර්ෂය අවසන් වන විට ඉන් 63 ක වැඩ අවසන් කොට ඇත.

### 11.3 වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම.

පොලිස් ස්ථාන, පොලිස් කාර්යාල ඇතුළු අනෙකුත් ගොඩනැගිලි 84 ක් ඉදිකිරීම සඳහා සැළසුම් කොට ඇති අතර, ඉදිකිරීමට යෝජිත පොලිස් ස්ථාන ගණන 52 කි. ඉන් පහත පොලිස් ස්ථානයන්හි වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කොට ඇත.

| | | | |
|---|---|---|---|
| 01. | අගුරුවාතොට | 05. | දෙනියාය |
| 02. | කටාන | 06. | නිලාවේලි |
| 03. | කොච්චිකඩේ | 07. | බදුල්ල |
| 04. | දිවුලපිටිය | 08. | වලස්මුල්ල |




පොලිස් ස්ථාන විවෘත කිරීමේ අවස්ථාවන්

## 12. මූල්‍ය ප්‍රගතිය

විශේෂ කාර්ය බලකායද ඇතුළුව පොලිස් දෙපාර්තමේන්තුවේ විවිධ සංවර්ධන ව්‍යාපෘති 2014 වර්ෂයතුළ ක්‍රියාත්මක කළ අතර, එම ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය සහ සමස්ථ පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් සම්බන්ධ මූල්‍ය ප්‍රගතිය පහත වගු මගින් දක්වා ඇත.

- **සංවර්ධන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය** වගු අංක 18

| # | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන ලැබීම් | වසර තුල මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදනය | 2014.12.31ට වියදම |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොලීසිය | | | | | |
| 1 | පෙරසවි නිවාස ව්‍යාපෘතිය | 89 | 435 | 524 | 516 |
| 2 | පොලිස් මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 500 | (485) | 15 | 6.6 |
| 3 | ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලය සංවර්ධනය කිරීම | 750 | (695.4) | 54.6 | 52.4 |
| 4 | පොලිස් නිලධාරීන් සඳහා වන නිවාස යෝජනා ක්‍රමය | 1,500 | (1,489) | 11 | - |
| 5 | පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය | 575.2 | (570) | 5.2 | 0.2 |
| 6 | පොදු ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය | 1,000 | (213) | 787 | 786 |
| උප එකතුව | | **4,414.2** | | **1,396.8** | **1,361.2** |
| විශේෂ කාර්ය බලකාය | | | | | |
| 1 | පෙරසවි නිවාස ව්‍යාපෘතිය | - | 305 | 305 | 303.5 |
| 2 | පොදු ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය | 200 | - | 200 | 108.7 |
| උප එකතුව | | **200** | **305** | **505** | **412.2** |
| මුළු එකතුව | | **4,614.2** | | **1,901.8** | **1,773.4** |

මූලාශ්‍රය: ගොඩනැගිලි කොට්ඨාසය

- **සමස්ථ මූල්‍ය ප්‍රගතිය** වගු අංක 19

| ආයතනය | 2014 වර්ෂයේ සංශෝධිත ප්‍රතිපාදන ප්‍රමාණය | | 2014.12.31 ට මුළු වියදම | | කාර්ය සාධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්ථන | ප්‍රාග්ධන | පුනරාවර්ථන | ප්‍රාග්ධන | පුනරාවර්ථන | ප්‍රාග්ධන |
| ශ්‍රී ලංකා පොලිසිය | 43,945,800 | 3,662,425 | 43,584,391 | 3,005,275 | 99.2 | 82 |
| විශේෂ කාර්ය බලකාය | 5,612,500 | 6,007,500 | 5,612,500 | 5,844,293 | 100 | 97.3 |

මූලාශ්‍රය: ප්‍රධාන ගණකාධිකාරි පොලිස් මූලස්ථානය

## 13. 2014 වර්ෂයේ කාර්ය සාධනය සැකවින්

රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතම ආයතනය වන පොලිස් දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේද විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් සිය රාජකාරිය ඉටු කිරීමට අපකැපවී ඇත.

පොලිසිය සෑම විටම නීතිගරුකව, විනයගරුකව හා අදර්ශ සම්පන්නව කටයුතු කලද, පවතින සාමජ වටපිටාව තුළ විවිධ බාධක සහ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ. එස් වුවද, රාජකාරිය ප්‍රමුඛ කොට සලකන පොලිස් දෙපාර්තමේන්තුව මෙම වර්ෂයේද සේවය සඳහා වූ කැපවීම තුළින් පහත සඳහන් ප්‍රගතීන් අත්කර ගෙන ඇති අතර, යම් යම් පසුබෑම්වලටද ලක්වී ඇත.

- අපරාධ විසඳීමේ ක්‍රියාවලිය තුළ විශාල ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර සීසීටීවී කැමරා තාක්ෂණය සහ ස්වයංක්‍රීය ඇඟිලි සළකුණු හඳුනා ගැනීමේ පද්ධතිය මගින් අපරාධ විමර්ශනය වේගවත් කර ඇත.
- ළමා හා කාන්තාවන්ට එරෙහි අපරාධ විසඳීමේ ප්‍රගතිය 24% - 42% දක්වා වර්ධනය වි ඇත.
- සුරා බදු සහ මත්ද්‍රව්‍ය වැරදි විසඳීමේ සාර්ථකත්වය 95% - 96% දක්වා වර්ධනය වී ඇත.
- දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි විසඳීමේදී 97% ක ඉහළ කාර්ය සාධන මට්ටමකට ලගාවී ඇති අතර, විශේෂ කාර්ය බලකායේ සක්‍රිය දායකත්වය උපරිමයෙන් ලබා දී ඇත.
- රිය අනතුරු පිළිබඳ කරනු ලබන දැනුවත් කිරීම් මගින් අනතුරු අඩුකර ගැනීමට සමත්වී ඇති අතර, රථ වාහන වැඩිවීම හා ජනගහණ වර්ධනයට සාපේක්ෂව රිය අනතුරු සංඛ්‍යාව සහ මිය යන සංඛ්‍යාවද ක්‍රමයෙන් අඩු වි ඇත.
- විවිධ පැමිණිලි විසඳීම ඉතා ඉහල ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර, 119 හදිසි ඇමතුම් සේවාවේ කාර්ය සාධන මට්ටම 99% කි.
- ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතීන් වල ඇතැම් ඉලක්ක ළගාකර ගැනීමේදී ප්‍රායෝගික බාධා මත පසුබෑමක් දැකිය හැකි වුවද, පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම සහ නව පොලිස් ස්ථාන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රගතියක් අත්කර ගෙන ඇත.